# ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරිය

මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය

## සේවාදායකයින් දැනුවත් කිරීමයි

1993 අංක 50 දරණ ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරිය පනත ප්‍රකාරව ශ්‍රී ලංකාවේ මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්තය නියාමනය හා පාලනය ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරිය සතුවේ.

**මුදල් විශුද්ධිකරණය සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම වැළැක්වීමේ නීති රෙගුලාසි ශක්තිමත් කිරීමට 2006 අංක 06 දරණ මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනතේ 2 වන වගන්තිය යටතේ අංක 2053/20 සහ 2018.01.10 දිනැති ගැසට් පත්‍රය මගින්,**

**1993 අංක 50 දරණ ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරිය පනතින් ආවරණය වන ලෝහ හා ගල් ඇතුළුව, එහෙත් ඒවාට සීමා නොවූ වටිනා ලෝහ වෙළෙඳුන් සහ මැණික් ගල් හා අඩ අනගි මැණික් ගල් වෙළෙඳුන් තම ගනුදෙනුකරුවන් සහ ප්‍රතිලාභී හිමිකරුවන් පිළිබඳව පහත තොරතුරු නිසි පරිදි ලේඛනගතව පවත්වාගෙන යාම අනිවාර්ය කර ඇත.**

**(අ) සම්පූර්ණ නම**
**(ආ) ස්ථිර පදිංචි ස්ථානයේ ලිපිනය හෝ තැපැල් ලිපිනය**
**(ඇ) රැකියාව, සේවා යෝජකයගේ හෝ ව්‍යාපාරයේ හෝ ප්‍රධාන කටයුත්තේ නම**
**(ඈ) ගනුදෙනුකරුගේ සහ ප්‍රතිලාභී හිමිකරුගේ ඡායාරූපය සහිත අනන්‍යතා ලේඛනයක් (ජාතික හැඳුනුම්පත /විදේශ ගමන් බලපත්‍රය/රියදුරු බලපත්‍රය)**
**(ඉ) උපන් දිනය**
**(ඊ) ජාතිය**
**(උ) අරමුදල් මූලාශ්‍ර**
**(ඌ) ගනුදෙනුවේ අරමුණ**
**(එ) දුරකතන අංක (නිවස, කාර්යාලය හෝ ජංගම)**

**තවද ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරිය විසින් නිකුත් කරනු ලබන සෑම මැණික් වෙළඳ බලපත්‍රයකම 7,8 සහ 9 වන කොන්දේසි මගින් සහ සෑම මැණික් ගැරීමේ බලපත්‍රයකම 15 වන කොන්දේසිය මගින් බලපත්‍රධාරියා විසින් පවත්වාගෙන යනු ලබන සියලුම ගනුදෙනු සම්බන්ධයෙන් වාර්තා තබා ගැනීම සහ අධිකාරිය වෙත වාර්තා සැපයීම සිදු කළ යුතු බවට අනිවාර්ය කර ඇත.**

**එසේ හෙයින් සියලු දෙනා මෙයින් දැනගත යුතුය.**

**යම් හෙයකින් ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරිය විසින් නිකුත් කරනු ලබන බලපත්‍රයක් යටතේ කර්මාන්තයක සහ/හෝ ව්‍යාපාරයක නියැළෙන ඕනෑම අයෙකු එකී බලපත්‍රයට අදාළව සිදුකරන සියළු ගනුදෙනු හා ඊට අනුශංගික සියලු කරුණු නිසි පරිදි ලේඛනගත කොට පවත්වාගෙන යා යුතු අතර අවශ්‍ය අවස්ථාවන්හිදී අධිකාරිය වෙත ඉදිරිපත් කළ යුතුය.**

☛ එසේ නොවන ඕනෑම අවස්ථාවකදී ඉහත කී නෛතික ප්‍රතිපාදන උල්ලංඝනය කළ බවට සලකා අවශ්‍ය නෛතික ක්‍රියා මාර්ග ගැනීමට අධිකාරිය විසින් කටයුතු කරන බවට මෙයින් දන්වනු ලැබේ.

**සභාපති සහ ප්‍රධාන විධායක නිලධාරි**

**ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරිය**

**අංක 25, ගෝල්ෆේස් ටෙරස්, කොළඹ 03.**

**දුරකථන** : 0112329295, 2325364, 2390645-8 **ෆැක්ස්** : 0112320758